**සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ගනුදෙනු වාර්තාව - 2018**

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව මෙම වාර්තාවෙන් දැක්වේ.

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම් වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධන ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

### 1.2 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩල වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 2 මෙහෙයුම් සමාලෝචනය

### 2.1 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2000 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වාම සංස්ථාව අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් 2013 වර්ෂය අවසානයට රු.7,710,099,424 ක ඍණ අගයක් දක්වා ශුද්ධ වත්කම් හීනවී පැවති අතර 2014 වර්ෂයේ සිදුකළ වත්කම් ප්‍රත්‍යාගණනය හේතුවෙන් ජනිතවූ රු.5,780,204,145 ක් වූ අතිරික්තය හේතුවෙන් ශුද්ධ වත්කම්හි ඍණ අගය 2015 වර්ෂයේදී රු.2,764,039,908 දක්වා අඩු විය. සංස්ථාවේ වගකීම් ලෙස මහා භාණ්ඩාගාරය විසින් නිකුත් | එකඟ වෙමි. | ශුද්ධ වත්කම් වැඩි කරගැනීමට කටයුතු කළ යුතු වීම |

කර තිබූ රු.4,397,000,000ක් වටිනා භාණ්ඩාගාර බැදුම්කර මහා භාණ්ඩාගාරය විසින් නිරවුල් කර 2016 වර්ෂයේදී ස්කන්ධ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීම හේතුවෙන් සංස්ථාවේ ශුද්ධ වත්කම් රු.1,388,648,519 ක අගයක් ගෙන තිබුණි.

**2.2 විගණනය සඳහා තොරතුරු නොලැබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ආනයනික සහල් තොග | - | ආනයනික සහල් තොග අදාල ගබඩාවලට භාරගැනීමේදී භාවිතා කරනු ලබන “භාරදීමේ සටහන සහ තොග භාරගැනීමේ සහතික” (DNSA) පත්‍ර 722 ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුරු එවා නැත. | සියළුම “භාරදීමේ සටහන් සහ තොග භාරගැනීමේ සහතික” ආරක්ෂා සහිතව තබාගත යුතු වීම. |
| (ආ) | වත්කම් බදු කුලිය | | සංස්ථාවේ 8 වන මහලෙහි හා 9 වන මහලෙහි පවත්වාගෙන යන ආයතන සඳහා සංස්ථාව විසින් ලබා දෙන පහසුකම් හා ඒවායේ සේවයෙහි යොදවන ලද සේවකයින් පිළිබඳව තොරතුරු විමසා, අංක TCM/C/CWE/INFO/2019/12 දරන 2019 මාර්තු 26 දිනැති ලිපිය නිකුත් කර තිබුණද ඒ සඳහා පිළිතුරු 2019 දෙසැම්බර් 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුරු එවා නැත. | විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඇ) | ආනයනික සහල් | | සහල් තොග ගබඩාවලට භාර ගැනීමට අදාල තොරතුරු ඇතුලත් DNSA පත්‍ර (CWE 404) වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් අවස්ථා 62 කදී සහල් කි.ග්‍රෑ.1,610,850 කට අදාලව DNSA පත්‍රවල ඡායා පිටපත් පමණක් විගණනයට ඉදිරිපත් කෙරුණි. | පිළිතුරු එවා නැත. | මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1991 අංක 31 දරන සමූපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනතේ 2.2 (අ) වගන්තිය | සංස්ථාවේ මුදල් ආයෝජනය කළ හැක්කේ පවත්නා පොදු සමාගම්වල පමණක් වුවද ඊට පටහැනිව රු.10 ක කොටසක නාමික ආයෝජනයක් සිදුකර "සී/ස සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා පෞද්ගලික සමාගම" හා "සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු පෞද්ගලික සමාගම"නමින් රාජ්‍ය සමාගම් 02 ක් ස්ථාපිත කර තිබුණි. | පිළිතුරු එවා නැත. | පනතට අනුව කටයුතු කල යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ (i) මු.රෙ.137 හා 138 | වවුචර්පත් සඳහා ගෙවීම් කිරීමේදී බලයලත් නිලධාරියෙකු විසින් වවුචර්පත් අනුමත කිරීම හා සහතික කිරීම සිදුකළ යුතු වුවත් අවස්ථා 32 කදී රු.6,938,866 ක් වටිනා වවුචර්පත් සඳහා ගෙවීම් කිරීමේදී අදාල අනුමැතිය හා සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණු අතර අවස්ථා 28 කදී රු. 40,757,032 ක් වටිනා වවුචර්පත් සඳහා ගෙවීම් කිරීමේදී බලයලත් නිලධාරියෙකුගේ අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි. | වවුචර් පත් සඳහා ගෙවීම් සිදු කිරීමේදී බලයලත් නිලධාරියෙකු විසින් වවුචර් පත් අනුමත කිරීම හා සහතික කිරීම සිදු කර නොමැති අවස්ථා 32 ක් හමු වූ අතර, එවා නැවත බලයලත් නිලධාරීන් විසින් අනුමත හා සහතික කිරීම සිදු කර ඇති බව කාරුණිකව දන්වමි. තවද අවස්ථා 28 කදී බලයලත් නිලධාරියෙකුගේ අනුමැතියෙන් තොරව ගෙවීම් කර ඇති වවුචර් පත් නැවත අනුමත කර, නිවැරදි කර ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම. |
| | (ii) මු.රෙ. 189 | ආනයනික සහල් ලබාගත් ආයතනයක් විසින් රු. 478,700,000 ක් වු ඉදිරි දාතම යෙදූ චෙක්පත් 23 ක් ලබා දී තිබූ අතර එම චෙක්පත් අගරු වූවද | මෙම ආයතනය විසින් එවා ඇති චෙක්පත් අගරු වූ අතර, මූල්‍ය අංශය විසින් ඒ බව දන්වා | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු |

| | | | |
|---|---|---|---|
| | සංස්ථාව විසින් එම චෙක්පත් සම්බන්ධයෙන් මෙම රෙගුලාසිය අනුව කටයුතු කර නොතිබුණු අතර අගරු චෙක්පත් වෙනුවෙන් ඉදිරි දාතම යෙදූ චෙක්පත් ලබාගෙන දිගින් දිගටම සහල් නිකුත් කර තිබුණි. | බැංකු අණකර පමණක් ලබා ගන්නා ලෙස අලෙවි අංශයට උපදෙස් දී ඇත. කෙසේ වෙතත් 2019 ඔක්තෝබර් 21 දින පැවති ජීවන වියදම් කමිටුව මගින් ලබාදුන් උපදෙස් අනුව රු.මිලියන 570 ක් වටිනා ඉදිරි දාතම චෙක්පත් 21 ක් මූල්‍ය අංශය විසින් භාර ගන්නා ලද අතර, ඒවාද මේ වන විට අගරු වී ඇත. ඒ පිළිබදව අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා අගරු චෙක්පත් පිලිබද තොරතුරු අදාල අංශ වලට දැනුම් දී ඇත. | වීම. |
| (iii) මු.රෙ.189 (උ) | අගරු වූ චෙක්පත් සඳහා නැවත මුදල් ලබාගැනීමේදී බැංකු අණකරයක් මගින් හෝ මුදලින්ම එම ගෙවීම් සඳහා මුදල් ලබගත යුතු වුවත් ආනයනික සහල් විකිණීමේදී සංස්ථාව ඊට පටහැනිව නැවත නැවතත් අගරු වූ චෙක්පත් සඳහා චෙක්පත් ලබාගැනීම සිදුකර තිබුණි. | අගරු චෙක්පත් පිලිබදවත්, චෙක්පත් වෙනුවට බැංකු අණකර ලබා ගැනීමටත්, අගරු චෙක්පත් වෙනුවෙන් ආයතනය විසින් දැරූ බැංකු ගාස්තු පිලිබදවත් දන්වා අලෙවි අංශයට ලිපි යවා දැනුම් දීම් සිදු කර ඇත. එසේ තිබියදීත් ඔවුන් විසින් දිගින් දිගටම චෙක්පත් මගින් ගණුදෙනු සිදු කළ අතර, බැංකුගත කිරීම සඳහා චෙක්පත් එවන ලදි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම. |
| (iv)මු. රෙ. 371 | අත්තිකාරම් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත් සංස්ථාවේ 2018 හා 2019 වර්ෂයන්හි අවස්ථා 8 කදී ලබාදෙන | මුරේ 371 ට අනුව ලබා දෙනු ලබන අත්තිකාරම් අදාල කාර්ය්‍යා අවසන් කළ | මුදල් රෙගුලාසි අනුව කටයුතු |

| | | | |
|---|---|---|---|
| | ලද රු.258,940 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | වහාම පියවිය යුතු නමුත්, එසේ නොමැති අවස්ථා කිහිපයක් 2018 හා 2019 වර්ෂ වල සිදු වී ඇති බව පිලිගන්නා අතර, ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයන් ලෙස අත්තිකාරම් පියවන ලෙස දන්වා ඇත. | කළ යුතු වීම. |
| (v)මු.රෙ.395 (ඇ) | බැංකු සැසඳුම් ප්‍රකාශන අදාල මාසයට පසු මාසයේ 15 වන දිනට පෙර පිළියෙල කළයුතු වුවත් සංස්ථාවේ බැංකු ගිණුම් 08 ක් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂය තුලදී මුදල් රෙගුලාසි 395 අනුව කටයුතු කරන බවට කාරුණිකව දැනුම් දෙමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම. |

**2.4 මුදල් කළමනාකරණය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා කාල පරිච්ඡේදය සඳහා රාජ්‍ය සමාගමක් සහ පෞද්ගලික සමාගමක් වෙත ගිවිසුම් ගත වීමකින් තොරව ප්‍රවාහන සේවා සැපයීම වෙනුවෙන් වටිනාකම පිළිවෙලින් රු.30,470,718 ක හා රු. 134,477,717 ක ඉන්වොයිස්පත් යවා තිබුණු අතර ඒ සඳහා වන කිසිඳු මුදලක් 2018 වර්ෂය තුළ ලැබී නොතිබුණු අතර පෙර වර්ෂවල සිට පැවත එන පිළිවෙලින් රු.134,948,620 ක හා රු.43,552,838 ක ශේෂයන් සමඟ තවදුරටත් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පවතින මුළු වටිනාකම පිළිවෙලින් රු.139,645,373 ක් හා රු.153,111,472 ක් විය. | ගිණුම්කරණ පද්ධතියට අනුව මෙම දත්තයන් 2018 දෙසැම්බර් 31 දින වන විට නිවැරදි වේ. | මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වෙළඳපලේ පවතින සහල් මිල පාලනය කිරීම සඳහා ජීවන වියදම් කැබිනට් අනු කමිටුවෙහි තීරණය පරිදි සංස්ථාව විසින් 2017 හා 2018 වර්ෂයන් වලදී සහල් ආනයනය කරන ලද අතර එම ආනයනික සහල් පෞද්ගලික අංශයට ණයට අලෙවි කිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ආයතන 4 කින් රු. 1,100,517,995 ක් ලැබිය යුතුව පැවතුණි. | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා පරිගණකගත කර සැසඳුමට ලක් කළ ගිණුම් ශේෂ අනුව පෞද්ගලික අංශය විසින් මිළට ගත් ආනයනික සහල් | මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | වෙනුවෙන් ලැබිය යුතු මුදල රු.1,100,517,995 කි. කෙසේ වෙතත් මෙම ආයතන වලින් අදාල මුදල් ලබා ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. | |
| (ඇ) | පාරිභෝගික කටයුතු අධිකාරියට 2011 වර්ෂයේ දී ගිවිසුම් ගත වීමකින් තොරව කෙටිකාලීන ණය පදනම මත ලබා දෙන ලද රු.1,000,000 ක ණය මුදල හා ඊට අදාල පොළිය ආපසු අයකර ගැනීමට 2018 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු එවා නැත. | මුදල් හා පොළිය අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | ජීවන වියදම් අනු කමිටු තීරණයකට අනුව සංස්ථාව විසින් 2017 අගෝස්තු මස 25 දින සිට 2018 අප්‍රේල් මස 18 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුල ඉන්දියාවෙන් සහල් මෙ.ටො.110,966 ක් ආනයනය කර තිබුණි. ඒ වෙනුවෙන් සංස්ථාව විසින් රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණු මුළු ණය මුදල රු.7,525,575,423 ක් වූ අතර 2018 දෙසැම්බර් මස 31 දිනට මුළු ණය මුදලින් රු.2,000,804,343 ක්ද මුළු ණය මුදලට අදාල පොළිය ලෙස රු.933,549,063 ක් ද සංස්ථාව විසින් ගෙවා තිබුණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් ගෙවිය යුතු ණය මුදල හා පොළිය රු.5,524,807,426 ක් විය. ආනයනික සහල් මිලදී ගන්නා ආයතන විසින් නිසි පරිදි ණයට ගත් සහල් වෙනුවෙන් ගෙවීම් නොකිරීම හේතුවෙන් සංස්ථාවට ඉක්මණින් ණය මුදල් පියවීමේ ඇති හැකියාව ඇහිරී තිබුණු අතර ඒ හේතුවෙන් දිගින් දිගටම අධික පොළී ප්‍රමාණයක් බැංකුව වෙත ගෙවීමට සිදුව තිබුණි. එමෙන්ම ජීවන වියදම් කමිටු නිර්දේශය අනුව සංස්ථාවට පිරිවැයට වඩා අඩු මිලකට සහල් අලෙවි කිරීමට සිදුවූ අතර එම පාඩුව පියවා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් සංස්ථාවට අයවිය යුතු මුළු මුදල රු.1,941,547,739 ක් විය. | 2018 දෙසැම්බර් 31 දින වන විට මෙම ණය මුදලින් රු.2,000,804,344 ක මුදලක් ගෙවූ අතර, පොලී වශයෙන් රු.933,549,063 ක් ගෙවා තිබුණි. ඒ අනුව 2018 වර්ෂය අවසානයේදී මහජන බැංකුවට ගෙවීමට ඇති මුදල රු.5,524,807,426 කි.2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයෙන් ලැබීමට නියමිතව තිබූ අලාභය රු.1,941,547,739 කි. මෙම මුදල ලබා දීමට මහ භාණ්ඩාගාරය විසින් එකග වූයේ 2020/2022 මධ්‍යකාලීන අයවැයෙනි. මහ භාණ්ඩාගාරයට මුදල් නොමැති බැවින්, එම මුදල නියමිත දිනට ගෙවීමට නොහැකි බව දන්වා එවා ඇත. | මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සංස්ථාවෙන් ණය පදනම මත ආනයනික සහල් ලබාගෙන තිබූ පෞද්ගලික ආයතනයක ශේෂයක් ලෙස 2019 ජුලි 10 දිනට ගෙවිය යුතු රු. 1,235,950(බැර) ශේෂයක් සංස්ථාවේ ගිණුම්කරණ පද්ධතියෙහි සටහන්ව තිබුණු අතර එසේ වීමට හේතු විගණනයට අනාවරණය නොවුණි. | මේ යටතේ දක්වා ඇති ගිණුම් ශේෂ මේ වන විට සැසඳීමට ලක් කර ඇති බැවින්, 2018 දෙසැම්බර් 31 දිනට එක් ආයතනයක රු.1,235,950 ක්වූ බැර ශේෂය ගිණුම් වල දක්වා ඇත. | මෙම ශේෂය පිලිබඳව නිවැරදි තහවුරු කිරීම් අලෙවි අංශයෙන් ලබාගෙන නිවැරදිව ගිණුම් තැබීම. |
| (ඊ) | බැංකු සුරක්ෂණ ඇපයක් ලබා ගෙන පමණක් ණයට ආනයනික සහල් නිකුත් කිරීමට තීරණය කළ පෞද්ගලික ආයතනයක් සඳහා එලෙස කටයුතු නොකර සහල් ණයට විකුණා තිබූ අතර 2018 දෙසැම්බර් 31 දිනට රු. 5,574,811 ක් අයවිය යුතු ව පැවතිණි. | 2018 දෙසැම්බර් 31 දිනට ගිණුම් පද්ධතිය අනුව මෙම ශේෂය නිවැරදි බව සහතික කරමි. | මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (උ) | 2018 ජනවාරි සිට මාර්තු දක්වා බැංකු ගිණුම් පරීක්ෂාවේදී සංස්ථාවේ බැංකු ගිණුම් දෙකක හඳුනා නොගත් තැන්පතු වශයෙන් රු.10,741,529 ක් පැවතුණි. | හඳුනා නොගත් තැන්පතු 2019 පෙබරවාරි 27 දින වන විට හඳුනාගෙන නිවැරදි ගිණුම් වල දක්වා ඇති අතර, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා හඳුනා නොගත් තැම්පතු කිසිවක් ගිණුම් වල නොමැත. | තැන්පතු මොනවාද යන්න හඳුනා ගෙන අදාල ගිණුම් වලට ගැලපිය යුතු වීම. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව සතු දේපල බදු පදනම මත කුලියට දීම වෙනුවෙන් රු.266,726,442 ක වටිනාකමක් සඳහා ඉන්වොයිස්පත් නිකුත් කර තිබූ අතර ඒ සඳහා රු.216,567,898 ක් ලැබී තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතුව පවතින ශේෂය රු.50,158,543 ක් විය. | පිළිතුරු එවා නැත. | මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.5 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව කළමනාකරණය විසින් 2014 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ආරම්භ කල “ගමට සවිය, සතොස බඩිය ” ජංගම අලෙවි රථ ව්‍යාපෘතිය 2015 ජනවාරි මාසයේදී අක්‍රීය වූ අතර එම ව්‍යාපෘතිය හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට | පිළිතුරු එවා නැත. | අදාල පාර්ශවයන්ගෙන් පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සංස්ථාවට දැරීමට සිදුවූ පාඩුව රු. 117,008,741 ක් විය. | | |
| (ආ) | තොග ගබඩා දෙකක් මගින් ආනයනික සහල් නිකුත් කිරීමේදී එක් ආයතනයට පමණක් සහල් කිලෝ ග්‍රෑමයක නියමිත මිලට රු. 1 ක් අඩුවෙන් සහල් කිලෝ ග්‍රෑම් 583,000 ක් නිකුත් කිරීම හේතුවෙන් සංස්ථාවට රු. 583,000 ක පාඩුවක් සිදුව තිබුණි. | ජීවන වියදම් අමාත්‍ය අනු කමිටුවේ අනුමැතිය පරිදි ශ්‍රී ලංකා පාරිභෝගික සමිති සංගමය වෙත ආනයනික පොන්නි සම්බා සහල් අලෙවියේදී කි.ග්‍රෑ.එකක් සඳහා රු. 1 ක මිල අඩුකර අලෙවි කිරීමට ගෙන තිබූ තීරණයට අනුව නිකුත් කර ඇත. | ජීවන වියදම් අමාත්‍ය අනු කමිටුවේ අනුමැතිය ලැබුණු බවට සාක්ෂි නොවූ අතර නියමිත මිලට සහල් නිකුත් කළ යුතුය. |
| (ඇ) | සහල් තොග අදාල ගබඩාවලට භාරදීමේදී විවිධ හේතූන් මත සහල් කි.ග්‍රෑ. 61,400 ක සහල් තොග විනාශ වී ඇති බව DNSA පරීක්ෂාවේදී විගණනයට නිරීක්ෂණය විය. | විගණන විමසුමෙහි සඳහන් 61,400 ප්‍රමාණය පහත සඳහන් කාරණා හේතු කොට ගෙන සිදුව ඇත.<br>1. බහාලුමෙහි කෘමි සතුන් සිටින බවට සඳහන්ව ඇතත් එම සහල් ධූමානය කිරීමෙන් පසුව අලෙවි කිරීමට කටයුතු කර ඇත.<br>2. DNSA අංක 524,530,557,571 ඇතුළු DNSA 26 ක් යටතේ මාතර තොග ගබඩාව වෙත සහල් තොග අලෙවි කිරීමෙන් පසුව අලෙවි කළ නොහැකි තත්වයේ සහල් මිටි 101 ක් පමණක් සත්ත්ව ආහාර සඳහා අලෙවි කිරීමට අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති අතර ලියාපදිංචි සත්ත්ව ආහාර නිෂ්පාදකයන් වෙත අලෙවි කර ඇත.<br>3. හිඟුරක්ගොඩ සහල් සංකීර්ණය දක්වා ධාවනය වෙමින් තිබූ | සහල් තොග හානි අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලොරි රථයක් අනතුරකට ලක්වීමෙන් සහල් මිටි 23 කට අදාල අලාභය,සී/ස නැව් සංස්ථාව මගින් අයකර ගැනීමට කටයුතු කර ඇත.<br>4.සමුපකාර තොග වෙළඳ සංස්ථාව වෙත, ආනයනික සැපයුම්කරු වෙතින් සහල් තොග ලැබිමේදි නැව් බඩු තොගයන්හී ආනයනික ලිපි ලේඛණවල සඳහන් ප්‍රමාණයට වඩා අඩුවෙන් ලද ප්‍රමාණය සඳහා වූ වටිනාකම අදාල පුද්ගලික සමාගම වෙතින් අයකර ගැනීමට කටයුතු කර ඇත. | |

## 2.6 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාව විසින් තක්සේරු වටිනාකම රු.54,722,228 ක් වූ වත්කම් සී/ස ලංකා සතොස සමාගමට පවරා දී තිබුණු අතර, ඒ වෙනුවට මුදල් ලබා ගැනීමට හෝ සමාගමේ කොටස් ලබා ගැනීමට හෝ විධිමත් එකඟතාවයකට 2018 දෙසැම්බර් 31 දින වන විටත් එළඹ නොතිබුණි. | පිළිතුරු එවා නැත. | මුදල් හෝ කොටස් ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සංස්ථාව විසින් 1999 වර්ෂයේදී පෞද්ගලික සමාගමක රු.9,923,710 ක් ආයෝජනය කර තිබුණද එම සමාගම දිගින් දිගටම පාඩු ලැබීම මත 1999 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කිසිදු ලාභාංශ මුදලක් ලැබී නොතිබුණි. | පිළිතුරු එවා නැත. | ආයෝජනය පිළිබඳව නැවත තක්සේරුවක් කළ යුතු වීම. |
| (ඇ) | වෙළඳ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2006 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණු රු.275,000,000 ක ණය මුදල ආපසු ගෙවීමට 2018 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | මෙම මුදල ආපසු ගෙවීමට සංස්ථාවට හැකියාවක් ලැබීමට නම් සංස්ථාව විසින් ලාභදායි ව්‍යාපෘති පමණක් සිදු කළ යුතුය. රජයේ අවශ්‍යතා | මුදල් ආපසු ගෙවිමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | මත සිදු කරන සියලුම ව්‍යාපෘති සංස්ථාවට අලාභදායි වන අතර. හුදෙක් ලාභ අපේක්ෂාවෙන් තොරව මහජන සුභසිද්ධිය සඳහා පමණක් ක්‍රියාකරන ආයතනයක් බැවින්, සංස්ථාවට ණය ගෙවීමට ඇති හැකියාව නොමැත. 2017/2018 සිදුකළ ව්‍යාපෘති වෙනුවෙන් වන අලාභය මහා භාණ්ඩාගාරය වෙතින් මේ වන තුරුම ලැබී නොමැති බව දන්වා සිටිමි. | |
| (ඇ) | 2014 දෙසැම්බර් මස ආරම්භ කරන ලද “ ගමට සවිය සතොස බඩිය ” ව්‍යාපෘතිය යටතේ සංස්ථාව විසින් මූල්‍ය කල්බදු පදනම මත මිලදී ගෙන අලෙවි සහකරුවන් අතර බෙදා දුන් මුළු වටිනාකම රු.1,456,368 ක් වූ ලොරි රථයක් ව්‍යාපෘති කටයුතු නවතා දමා වසර 05 ට වැඩි කලක් ගත වුවද තවමත් සංස්ථාව වෙත පවරාගෙන නොතිබුණි. | පිළිතුරු එවා නැත. | ලොරි රථය ආපසු සංස්ථාවට ලබාගැනීමට ක්‍රියා කල යුතු වීම. |
| (ඉ) | මිල්කෝ ව්‍යාපෘතිය 2018 ජනවාරි මස 31 දිනෙන් අවසන් කර තිබුණද කළමනාකරණය විසින් අදාල ලොරි රථ හිමියන්ට ඒ බව කලින් දන්වා නොතිබීම හේතුවෙන් ගිවිසුම් ප්‍රකාරව ශීතාගාර පහසුකම් සහිත ලොරි රථ 3 ක් සඳහා පෙබරවාරි මස කුලිය වශයෙන් රු. 416,000 ක් ගෙවීමට සිදුව තිබුණි.<br>තවද 2017 දෙසැම්බර් මස ගිවිසුම් කාලය අවසන් වූ ලොරි රථයක් සඳහා 2018 ජනවාරි මාසය සඳහා රු.112,000 ක් ගෙවා තිබුණු අතර 2017 වර්ෂයේ මාස දෙකක් තුලදී අදාල ධාවන කටයුතු සඳහා යෙදවීමකින් තොරව හා එම ලොරි රථය ශීතාගාර පහසුකම් සහිතව නොතිබියදී රු.224,000 ක් ද ගෙවා තිබුණි. | ගිවිසුමට අනුව අදාල ලොරිරථ ධාවනයෙන් ඉවත් කිරීමට නම් ඒ බව මසකට පෙර දැනුම් දීම සිදු කළ යුතුය. මෙම ව්‍යාපෘතිය හදිසියේ අවසන් කළ අතර, එසේ දැනුම් දීම සඳහා කාලයක් නොතිබූ බව අලෙවි අංශය විසින් දන්වා සිටින ලදි. එමනිසා එවකට සිටි මූල්‍ය අංශ ප්‍රධානින් විසින් ගෙවීම් කිරීමට උපදෙස් දී ඇත. | අදාල පුද්ගලයන්ගෙන් පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | සංස්ථාව විසින් ණය පදනම මත සහල් ලබාදීමේදී පෞද්ගලික සමාගමකින් රු.100,000,000 ක බැංකු ඇපකර 02 ක් ලබාගෙන තිබුණුද එම බැංකු ඇපකර සත්‍ය ලේඛන බවට තහවුරු කර නොගෙන අදාල සමාගම විසින් දිගින් දිගටම ණය නොගෙවා සිටියදි ආනයනික සහල් නිකුත් කර තිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනට ගිණුම් පද්ධතියට අනුව මෙම ශේෂය සමග එකඟ වෙමි. | අදාල පුද්ගලයන්ගෙන් පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | 2018 දෙසැම්බර් 31 වන විට මෙම බැංකු ඇපකර සාවද්‍ය ලේඛන බවට හෙළිදරව් වී තිබුණු අතර එදිනට එම සමාගමෙන් අයවිය යුතු මුදල රු. 118,011,334 ක් විය. | | |
| (උ) | සංස්ථාවෙන් ප්‍රවාහන පහසුකම් ලබා ගන්නා ආයතනය හා සංස්ථාව අතර එක් එක් අලෙවි සැල් සඳහා රිය ධාවනය වන දුර ප්‍රමාණය පිළිබඳව පූර්ව එකඟතාවයකට එළඹ නොතිබුණෙන් සංස්ථාව නිකුත් කරන ඉන්වොයිස් වටිනාකමෙන් රු.1,427,347 ක් එම ආයතන විසින් ගෙවා නොතිබුණි. | ලොරිරථ ගමන් කළ යුතු මාර්ගය පිලිබදව සහ ඒවායේ දුර පිලිබදව පැහැදිලි එකගතාවයකට පැමිණීම ප්‍රායෝගිකව කළ නොහැකි කාර්යකි. ඒ ඒ අවස්ථා වල ලංකා සතොස ආයතනය විසින් ලබා දෙන අලෙවි ශාඛා අනුව ලොරිරථ වල ගමන් චාරිකාව තීරණය වේ. මෙහිදී ලංකා සතොස සමග සාකච්ඡා කර එම දුර පිලිබදව ඔවුන් සෑහීමකට පත් නොවන්නේ නම් ඒ බැව් සතොස ආයතනය දැණුවත් කර එකගතාවයකට පැමිණ බිල් වලින් අඩු කිරීමට තීරණය කරන ලදි. 2020 වර්ෂයේ සිට මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර සිටින බව දන්වමි. | නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |
| (ඌ) | රාජ්‍ය සමාගමක ගබඩාවලින් සංස්ථාවේ ලොරි රථ සඳහා භාණ්ඩ පැටවීමේදි ඒ සඳහා වගකිවයුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයක් නොමැති විම නිසා සිදුවන භාණ්ඩ අඩුමාන වෙනුවෙන් සංස්ථාවට 2018 වර්ෂයේදි රු.534,775 ක මුල්‍යමය පාඩුවක් දැරිමට සිදු වී තිබුණි. | මේ සදහා විධිමත් ක්‍රමවේදයක් සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කිරීම සදහා අවශ්‍ය අංශ දැණුවත් කර ඇති අතර, මේ පිලිබදව අධ්‍යක්ෂ මණ්ඩලයේද විශේෂ අවධානය යොමු කර ඇත. එමෙන්ම මෙම අඩුමාන සදහා සේවකයින් වගකීමට යටත් වේ නම් එම මුදල ඔවුන්ගේ වැටුපෙන් අය කිරීමට අවශ්‍ය කටයුතු දැනටමත් සිදු කර ඇත. | නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |

## 2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **බදු දේපල කළමනාකරණය** | | |
| (අ) | සංස්ථාව විසින් සිදු කර ඇති වත්කම් ප්‍රත්‍යාගණන වාර්ථාවෙහි සඳහන් සංස්ථාව සතු බදු දිය හැකි දේපල සම්බන්ධ වර්ග අඩි ප්‍රමාණය හා සංස්ථාව විසින් 2018 වර්ෂය සඳහා බදු කටයුතු සඳහා ලබා දි තිබූ වර්ග අඩි ප්‍රමාණය සම්බන්ධ නියදි තොරතුරු විශ්ලේෂණයේදි බදු කටයුතු සඳහා ලබා නොදී ඌන උපයෝජිතව පවතින වර්ග අඩි ප්‍රමාණය 280,515 ක් විය. | ඌන උපයෝජිත ඉඩ ප්‍රමාණයන් බදු දිම සඳහා පුවත්පත් මඟින් ද වරින්වර කැඳවීම් කර ඇති නමුත් ඒ සඳහා සාර්ථක ප්‍රතිචාර නොලැබුණි. | ඌන උපයෝජිත ඉඩ ප්‍රමාණයන් බදු දිම සඳහා ක්‍රමවේදයක් සකස් කිරිම. |
| (ආ) | තක්සේරු වාර්තාවේ දැක්වෙන වෙළඳපල අගයට වඩා අඩු අගයකට සංස්ථාව සතු දේපල බදු දීම නිසා සංස්ථාවට සිදුවන අලාභය මසකට රු.1,869,156 ක් වූ අතර වාර්ෂිකව ආදායම් අහිමි වීම රු. 22,429,875 ක් විය. | පාරිභෝගික අධිකාරිය සඳහා ප්‍රධාන කාර්යාලයේ 1 වන හා 2 වන මහල බදු පදනම මත ලබාදී ඇති නමුත් එම ආයතනයට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම තුල නියමිත බදු කුලිය අය කරගැනීමට නොහැකි වී ඇත. සතොස ආයතනයේම උපසමාගමක් ලෙස ක්‍රියාත්මක වන " සතොස ආරක්ෂක හා පොදු (පෞද්) සමාගම " වෙතින් ද නියමිත පරිදි බදු කුලී මුදල් අයකර ගැනීමේදී මෙම ගැටළු සහගත තත්වයම මතුවී ඇත. | වෙළඳපල අගය අනුව බදු දේපල බදු දීම සිදු කල යුතු වීම. |
| (ඇ) | සංස්ථාව විසින් බදු දෙන ලද වත්කම් භාවිතා කරනු ලබන ආයතන හා පුද්ගලයන් 33 ක ගෙන් (බදු ගැනුම්කරු) 2018 වර්ෂය සඳහා බදු වාරික කිහිපයක් අයකර ගැනීමට කළමනාකරණය අපොහොසත් වීමෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට රු.388,090 ක බදු ආදායමක් සංස්ථාවට ලැබිය යුතුව පැවතිණි. | වැලිසර ගබඩා සංකීර්ණය තුල බදු පදනම මත ලබාදී ඇති පෞද්ගලික කඩ වලින් කුලී මුදල් අයකර ගැනීමේදී ඔවුන් නියමිත පරිදි ගෙවීම පැහැර හරින අවස්ථාවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ද කටයුතු කර ඇත. | බදු කුලිය නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අවස්ථා 5 කදී සංස්ථාව විසින් බදු දෙන ලද මාසික බදු වටිනාකම රු. 904,347 ක් වූ දේපල සඳහා 2018 වර්ෂයේ කිසිදු වාරිකයක් අයකර ගැනීමට කළමනාකරණය අපොහොසත් වීමෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට රු. 8,975,350 ක බදු ආදායමක් සංස්ථාවට ලැබිය යුතුව පැවතිණි. | (ඈ) සහ (ඉ). සංසරාජමාවත පිහිටි ගබඩා සංකීර්ණයේ බදු කුලී ගෙවීම පැහැර හරින ලද "අසාත්සාලි පදනම " වෙතින් සියළු හිඟමුදල් අයකර ගෙන ඇති අතර රු: 438,484 ක අධිභාර මුදල (දඩ මුදල්) පමණක් දැනට අයකර ගැනීමට නියමිතව ඇත. බදු කුලී ගෙවීම ප්‍රමාද කළ සහ ඉදිරිදාතම යෙදූ චෙක්පතක් ලබාදී රු: 1,155,358 ක මුදලක් ගෙවීම පැහැර හරින ලද මාළිගාවත්ත ගබඩාවේ බදු පදනම මත සිටි පෞද්ගලික සමාගමෙන් මුදල් අයකර ගෙන ඇත. මේ වනවිට එම ආයතන දෙකම ඉවත් කර ඇත. | බදු වාරික නිසි පරිදි අයකල යුතු වීම. |
| (ඉ) | පෞද්ගලික ආයතනයක් හා පුද්ගලයෙක් විසින් බදු ගත් වටිනාකමට වඩා අඩු වටිනාකමක් බදු කුලී වශයෙන් ගෙවීම හේතුවෙන් සංස්ථාවට මාසිකව රු.43,225 ක වටිනාකමක් අහිමි වී තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා එසේ අහිමි වූ ආදායම රු.301,975 ක් විය. | - එම - | බදු වාරික නිසි පරිදි අයකල යුතු වීම. |
| (ඊ) | සතොස මහ ලේකම් කාර්යාලයෙහි 8 වන මහලෙහි බදු දිය හැකි වර්ග අඩි ප්‍රමාණය, සංස්ථාව විසින් 2014 සිදු කරන ලද වත්කම් තක්සේරු වාර්ථාව අනුව වර්ග අඩි 9857 ක් වූ අතර එහි වර්ග අඩියක වෙළඳපල වටිනාකම රු.80 ක් විය. මෙය බදු කටයුතු සඳහා ලබා දුන්නේ නම් මාසික බදු කුලි ආදායම රු.788,560 ක් වන අතර එහි වාර්ෂික වටිනාකම රු.9,462,720 ක් බව නිරීක්ෂණය විය.තවද මෙහිදි සිදු කරන ලද ස්ථානීය පරික්ෂාවේදී එම මහලෙහි බාහිර ආයතන/පුද්ගලයන් රාජකාරි කටයුතුවල නිරත වී සිටි අයුරු නිරීක්ෂණය වූ අතර ඒ සඳහා වූ බදු කුලී සංස්ථාවට ලැබී නොතිබුණි. 8 වන මහල පිළිබඳ තොරතුරු විමසා නිකුත් කරන ලද තොරතුරු කැඳවීම් ලිපියට (2019 මාර්තු 18 දිනැති | සතොස ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ 08 වන මහලෙහි දීර්ඝ කාලීනව අභ්‍යන්තරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති කළමණාකරණ ඒකකය ( IDPS) ආයතනය අමාත්‍ය මණ්ඩල තීරණයක් පදනම් කර ගනිමින් ස්ථාපිත කිරීමට සතොස ආයතනය අයත්ව පැවති " කර්මාන්ත හා වාණිජ කටයුතු හා දිතුකාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම " අමාත්‍යාංශය විසින් කටයුතු කර තිබුණි. ඒ අනුව 2018 අගෝස්තු 31 සිට 2018 ඔක්තෝබර් 25 දක්වා කුලී ගෙවීම නොකළ අතර 2019 ජනවාරි 01 සිට 2019 | නිසි පරිදි බදු කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | CM/C/CWE/INFO/2019 /11 ලිපිය) 2020 ජුනි 25 දින වන විටත් ප්‍රමාණවත් හා අදාල පිලිතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සැප්තැම්බර් 30 දක්වා මාසිකව රු: 239,292 ක බැගින් බදු කුලී අයකර ගැනීමට කටයුතු කරන ලදි. | |
| (උ) | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 9 වන මහලෙහි පවතින වර්ග අඩි 4080 ක ප්‍රමාණයක් බාහිර ආයතන 2ක් සඳහා ලබා දි ඇති බව දන්වා තිබුණද කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක I&C/COM/2P/2/159 දරන 2017 පෙබරවාරි 27 දිනැති ලිපියට අනුව වර්ග අඩි 942 ක ප්‍රමාණයක් පමණක් ඉහත ආයතන වෙත ලබා දෙන ලෙස ඉල්ලුම් කර තිබුණි. මේ අනුව වර්ග අඩි 3138 ක් එසේ අනුමැතියකින් තොරව බාහිර ආයතන සඳහා ලබා දීම නිසා සංස්ථාවට අහිමි වී ඇති මාසික බදු කුලි ආදායම රු.251,040 ක් වන අතර වාර්ෂිකව අහිමි වන බදු කුලි ආදායම රු.3,012,480 ක් විය. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2017 පෙබරවාරි 27 හා 2017 ඔක්තෝබර් 16 දිනැති I & C /COM/ 2P/2/159 දරණ ලිපි මඟින් කර ඇති දැනුම්දීම් පරිදි බදු කුලියකින් තොරව එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO) ආයතනය වෙත ඔවුන්ගේ කාර්යාල කටයුතු සඳහා ලබාදී ඇත. එම ආයතනය සහ අමාත්‍යාංශය විසින් අත්සන් කරන ලද ගිවිසුම අනුව 2020 ඔක්තෝබර් 31 දක්වා එම ආයතනය වෙත කාර්යාල පහසුකම් සඳහා ලබාදී ඇත. පසුව එය නැවතත් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සමඟ 2019 නොවැම්බර් 11 දින ගිවිසුම් ගතව 2021 පෙබරවාරි 28 දින දක්වා දීර්ඝ කරගෙන ඇත. | දේපල බදු දිය හැක්කේ දේපල අයිතිය සතු ආයතනයට බැවින් අදාල තීරණ සංස්ථාව ගත යුතු බව. |

**2.8** **මතභේදයට තුඩු දෙන ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 අගෝස්තු 26 දිනැති අංක 2010/1753/34 අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව එවකට සිටි සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව 2007 පෙබරවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි විධායක මට්ටමේ වැඩබලන ලද නිළධාරීන් තිදෙනෙකු උක්ත වැඩ බැලීමේ තනතුරුවල ස්ථිරව පිහිටුවීමට තීරණය කර තිබුණු බව | 2010/1753/34 අධ්‍යක්ෂ මණ්ඩලීය තීරණය පරිදි එවකට සිටි සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ , ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය පරිදි උසස්වීම් ලද නිලධාරීන් 03 දෙනා වෙත හිඟ වැටුප් ගෙවීම සම්බන්ධයෙනි.<br>I. ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා එවකට සිටි සභාපතිතුමා විසින් 2020 | ගෙවීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය හා සංස්ථා සභාපතිවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. එසේම සත්‍ය අනුමැතියක් ලබා ගෙන තිබේද යන්න පරීක්ෂා කළ යුතුය. |

දක්වා තිබුණද නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාවේදී අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාදෙන ලද ලිපිවල මුල් පිටපත් නොතිබුණි. එසේම හිඟ වැටුප් හා හිඟ වැටුප් වර්ධක ලෙස ගණනය කරන ලද රු. 11,511,088 ක් 2018 වර්ෂයේදී එනම් එවක සිටි අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට වසර 08 කට පසු වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය හා සංස්ථා සභාපතිවරයාගේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණු අතර එම ගෙවීම සඳහා බලය දීම හා අනුමැතිය ලබාදුන් නිලධාරීන් අතර මෙම ගෙවීම ලබාගත් නිලධාරීන් දෙදෙනෙක් ද විය.එසේම මෙම නිලධාරීන් දෙදෙනා ඔවුන් වැඩ තහනමට ලක්ව සිටි කාලපරිච්ඡේදයට අදාල හිඟ වැටුප් හා හිඟ වැටුප් වර්ධක වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය හා සංස්ථා සභාපතිවරයාගේ අනුමැතියකින් තොරව
වරින් වර රු.3,718,552 ක් 2018 වර්ෂය තුලදී විද්‍යුත් බැංකු ක්‍රමය හරහා ලබාගෙන තිබුණි. මෙම ගෙවීම් සඳහාද බලය හා අනුමැතිය ලබා දුන් නිළධාරීන් දෙදෙනාද ඔවුන්ම විය.

සැප්තැම්බර් 01 දිනැති CH/10 යොමු අංක දරණ ලිපිය ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇති බව එවකට සිටි මුදල් කළමනාකරු විසින් "සත්‍ය පිටපතක්" ලෙස සහතික කර ඇති ලිපිය මගින් නිරීක්ෂණය වේ.

II. 2013 ජූලි මාසයේදී සතොස ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ලෙහි 07 වන මහලේ ඇති වූ හදිසි ගිනි ගැනීම හේතුවෙන් සභාපති කාර්යාලය සහ මුදල් කළමනාකරු කාර්යාලයද ගින්නෙන් විනාශ වී ඇති බැවින් එම ලිපියේ මුල් පිටපත සොයා ගැනීමට නොමැති බව සඳහන් කරමි.

III. මෙම අධ්‍යක්ෂ මණ්ඩලීය තීරණය පරිදි එම නිලධාරීන් තිදෙනා (03) වෙත ගෙවිය යුතු හිඟ වැටුප් මුදල් (2007 පෙබරවාරි01 සිට 2010 අගෝස්තු 30 දක්වා වූ කාලයට) වලින් කොටසක් 2011 වර්ෂය තුලදීම මුදල් කළමනාකරු වෙත රු.172,260 ක් ද නියෝජ්‍ය මුදල් කළමනාකරු වෙත රු.157,410 ක් ද වශයෙන් ගෙවා තිබුණි.

IV. ඉතිරි හිඟ වැටුප් මුදල් 2018 පෙබරවාරි මාසයේදී හිටපු මුදල් කළමනාකරු විසින් ඉහත සඳහන් අංක 2010/1753/34 දරණ අධ්‍යක්ෂ මණ්ඩලීය තීරණය පරිදි ගෙවා ඇති අතර අදාල වවුචර්පත් ඔහු විසින් සහ නියෝජ්‍ය කළමනාකරු විසින්

| | | | |
|---|---|---|---|
| | | අත්සන් කර ඇත.2018 වර්ෂයේ සිටි සභාපතිව දැනුවත් කිරීමක් කර නොතිබුණි.මෙම ගෙවීම සඳහා බලය දීම හා අනුමත කිරීම් සිදුකරන ලද එක් නිලධාරියෙකු විශ්‍රාම ගොස් ඇති අතර අනෙක් නිලධාරියා එම රාජකාරී සිදු නොකරනු ලැබේ. | |
| (ආ) | සංස්ථාවේ ගබඩා මගින් ලංකා සතොස සමාගම වෙත ආනයනික සහල් නිකුත් කිරීමේදී නියමිත බරින්, තාර බර ලෙස රු. 2,456,219 ක වටිනාකම වූ සහල් කි.ග්‍රෑ. 38,244 ක් හා දේශීය සහල් නිකුත් කිරීමේදී නියමිත බරින්, තාර බර ලෙස රු. 651,344 ක වටිනාකම වූ සහල් කි.ග්‍රෑ. 9,588 ක් ණය මැමවලින් අඩු කර තිබුණි. එහෙත් සංස්ථාවේ කළමනාකරණය විසින් එවැනි උපදේශයක් ලබා දී තිබූ බවට වන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සහල් නිකුත් කිරීමේදී ඇසුරුම් මළු සමඟ නිකුත් කරන අතර ඇසුරුම් මල්ලක සාමාන්‍ය බර ග්‍රෑම් 100 කි. ඒ අනුව පාලම් තරාදි මඟින් කිරා " **තාර බර** " වශයෙන් ඉහත පදනම මත ලංකා සතොස ආයතනය විසින් අඩුකර ඇත. අලෙවිකරණ ලද සහල් ප්‍රමාණයේ විශාලත්වය මත මෙම ගණනය කිරීම සිදුව ඇත. | අභ්‍යන්තර පාලන පද්ධතියේදී මෙවැනි අඩු කිරීම් සඳහා බලය ලත් නිලධාරියකු හඳුනා ගෙන ඔහුගේ අනුමැතිය මත කටයුතු කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතු වීම. |

**2.9 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයක් හා පුද්ගලයින් 22 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට සංස්ථාවට එරෙහිව රු. 17,060,177 ක වන්දි ඉල්ලා නඩු 27 ක් පවරා ඇති අතර සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුල රු. 847,372 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. තවද මෙම නඩු කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 433,200 ක් නීති වියදම් වශයෙන් දරා තිබුණි. | නීති අංශයේ වාර්තා සමඟ සැසඳේ. | |
| (ආ) | සංස්ථාව විසින් ආයතන 07 කට හා පුද්ගලයින් 04 දෙනෙකුට එරෙහිව රු.101,695,558 ක මුදලක් ඉල්ලා නඩු 11 ක් පවරා ඇති අතර එමඟින් | | |

රු. 735,000 ක මුදලක් අයකර ගෙන තිබුණි.තවද මෙම නඩු කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.227,625 ක් නීති වියදම් වශයෙන් දරා තිබුණි.

**2.10 කාර්ය මණ්ඩල පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය කළමණාකරණ ශ්‍රේණියේ තනතුරු 21 කින්ද, කළමණාකරණ සහකාර මට්ටමේ තනතුරු 51 කින්ද, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 247 ක්ද වශයෙන් මුළු තනතුරු 319 කින් සමන්විත වූ අතර 2018 දෙසැම්බර් 31 වන විට අතිරික්ත සේවක සංඛ්‍යාව 167 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 32 ක් විය. මෙම පුරප්පාඩු වලින් 09 ක් කළමනාකරණ ශ්‍රේණියේ තනතුරු සඳහා විය. | කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන රියදුරු 13, කාර්යසහායක 32 යන කාර්ය මණ්ඩලය අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ඇත.එම සේවකයන් සඳහා තීරණයක් ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් විමසා ඇත. | අනුමත කාර්ය මණ්ඩලය තුල කටයුතු කළ යුතු වීම. |

**3 ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**3.1 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සංස්ථාවේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද එය කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි. | පිළිතුරු එවා නැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකර තිබුණද එහි මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | පිළිතුරු එවා නැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |